**ශීර්ෂය 291 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 291 - **වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2022** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 12 දින දී ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්**,** එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි සහනාධාර හා මාරුකිරීම් යටතේ පෙන්විය යුතු රු. 3,111,073 ක් පුද්ගල පඩිනඩි යටතේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සහනාධාර හා මාරුකිරීම් මඟින් පෙන්විය යුත්තේ රජයේ ආදායමින් ආපසු ගෙවීම් ආකාරයේ වියදම් වන අතර රජයේ නිලධාරීන්ගේ ණය පොලිය පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ නිවැරදිව දක්වා ඇති බව. | අංක 1506 දරන රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී වැය විෂයය යටතේ වෙනම ගිණුම්ගත කරන හෙයින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ද ඒ ආකාරයට නිරූපණය කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් මාසයේදී රු. 555,000 කට අලෙවි කරන ලද මෝටර් රථ ආයෝජන ක්‍රියාකාරකම් හි මුදල් ගලා ඒමක් ලෙස දක්වනු වෙනුවට වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වශයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම සකස් කිරීමට කටයුතු කරනු ලබන බව. | දිගු කාලීන වත්කමක් වූ මෝටර් රථ අලෙවියෙන් ලද මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුය. |

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය</u>**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් බී ගිණුම හා CC 10 ලේඛනය අතර සැසඳීමේදී තිස්තුන්දෙනෙකුගේ තනතුරු නාමය සහ නිලධාරින් හය දෙනෙකුගේ නම් වෙනස් ව පැවති අතර නිලධාරීන් දහසය දෙනෙකුගේ තනතුරු නාමය CC 10 ලේඛනයේ සඳහන් කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට එම නිලධාරින්ගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂය රු. 8,007,750 ක් විය. | මාණ්ඩලික සේවයේ නිලධාරීන් ජ්‍යෙෂ්ඨත්වයට පත්වීම මත තනතුරු නාමයන් වෙනස් වන අතර සෙසු නිලධාරීන්ගේ තනතුරු නාමයන් හා නම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | අත්තිකාරම් බී ගිණුමේ හා CC 10 ලේඛනයේ නිලධාරියාගේ නම හා තනතුරු නාමය නිවැරදිව ඇතුළත් කළ යුතුය. |

**(ආ) <u>දේපළ පිරියත හා උපකරණ</u>**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ රු.42,007,000 කට තක්සේරු කර දක්වා තිබුණු මොරටුව, මාතර සහ ගොඩවාය යන ඉඩම් 03 ක අයිතිය 2022 දෙසැම්බර් 31 දින වන විට ද දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි. | මොරටුව කාර්යාල ඉඩම සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව එම අමාත්‍යාංශය මඟින් මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ බව දන්වා ඇත. මාතර කාර්යාල ඉඩම පවරාගැනීමට අදාළව වර්තමාන තත්ත්වය විමසා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත 2023.03.22 දින ලිපි යොමු කර ඇති බව.<br><br>ගොඩවාය නිවාඩු නිකේතනයේ ඉඩම පවරාදීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන මෙන් දන්වා ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට වෙත 2023.04.04 දින ලිපියක් යොමු කර ඇති බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන හලාවත ප්‍රාදේශීය කාර්යාලය, රු.2,800,000 කට ඇස්තමේන්තු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | තොරතුරු පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| **(iii)** | 2014 ජුනි 20 දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා දී තිබුණු ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩම රු.12,400,000 කටත්, ගොඩනැගිලි රු.44,000,000 කටත් ඇස්තමේන්තු කර තිබුණ ද, ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම්ගත කරන බව. | මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| **(iv)** | 1999 හා 2017 වර්ෂයන්හි දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර රු.9,800,000 කට තක්සේරු කර තිබුණු මෝටර් රථ දෙකක් සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනය මඟින් 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත පවරන ලද යතුරුපැදි දෙකක් ඇතුලුව දෙපාර්තමේන්තුව සතු යතුරු පැදි 08 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කිරීමෙන් පසුව භාවිතයට හා ධාවනයට යොදාගත් මෙම වාහන 02 හි තක්සේරු වාර්තාව 2023.02.16 දින ලැබී ඇති අතර 2023 වර්ෂයේ ගිණුම්ගත කර ඇති බව.<br>යතුරුපැදි ගිණුම්ගත නොකිරීම සම්බන්ධයෙන් අදහස් දක්වා නොමැත. | මෝටර් රථ හා යතුරුපැදි වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| **(v)** | ප්‍රසම්පාදන කමිටු තීරණයක් අනුව 2022 හා 2023 වර්ෂයන්හි රු. 2,192,000 කට අලෙවි කරන ලද වාහන 07 ක් වාහන අලෙවිකරණ අවස්ථාව වන විටත් මූල්‍ය නොවන වත්කම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | 2019.07.03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක: SA/MA/MA-02/ Assets අනුව සියළුම ස්ථාවර වත්කම් ගිණුම් ගත කරන අවස්ථාව වනවිට එම වාහන භාවිතයෙන් හා ධාවනයෙන් ඉවත් කර අපහරණ තත්ත්වයේ පැවති බැවින් ඒවා ගිණුම් ගත නොකරන ලදි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව සියලුම වාහන වත්කම් වශයෙන් ගිණුම්ගත කළ යුතුය. |

(ඇ) **අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව "අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් දරන ලද වියදම්" රු. 10,423,210 ක් වුවද, එය රු. 9,370,493 ක් වශයෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි දක්වා තිබුණි. | අනෙකුත් ශීර්ෂ යටතේ දරන ලද මුළු වියදම රු.10,423,210ක් වුවත් අක්මුදල් මගින් ඒ වෙනුවෙන් දැරූ වියදම රු.9,370,493 ක් වන නිසා අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට එම අගය ලබා ගෙන ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව හරස් සටහන් මගින් දරන ලද වියදම් ද ඇතුළත් කළ යුතුය. |

(ඈ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය පවත්වා නොතිබුණි. | ලේඛන සකස් කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනය පවත්නාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අත්තිකාරම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | අත්තිකාරම් ලේඛනයේ අඩුපාඩු මඟ හරවාගෙන පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනය පවත්නාගෙන යා යුතුය. |

(ඉ) **ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කරගැනීමට කටයුතු කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ඊ)** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධිත පනතේ 31(4) වගන්තිය | 2,892,165 | 2015 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වැයකර තිබුණු රු.3,410,551 කින් රු.2,892,165 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණු අතර එම අගය වැය කළ මුදලින් සියයට 84.8 ක් විය. | අදාළ ලිපිනයන් හි නොමැති අයගෙන් මුදල් අය කර ගැනීම ගැටලුකාරී වී ඇති බව හා වියදම් අය කර ගැනීම සඳහා නීති අංශය මඟින් අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම් කරමින් පවතින බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා දරන ලද වියදම් අදාළ පුද්ගලයන් ගෙන් අයකර ගැනීම සඳහා සුදුසු කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | - | ඇප ආඥා පනතට අනුව අදාළ නිළධාරීන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට 2023.03.09 දින කටයුතු කර ඇති බව. | අදාළ නිලධාරින්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටුයුතු කළ යුතුය. |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සෑම ඉන්ධන පරීක්ෂාවක්ම මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කළ යුතු වුවද, ආයතනයේ වාහන 17 ක් සම්බන්ධයෙන් එලෙස ඉන්ධන පරීක්ෂා කර නොතිබුණි. | 2022 වර්ෂයේදී රට තුළ ඉන්ධන අර්බුදයක් පැවතීම නිසා වාර්ෂික ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට නොහැකි වූ බව හා මෙම වසරේදී වාහන ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරන බව. | නිසි ආකාරයට ඉන්ධන පරීක්ෂාව සිදුකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

හිඟහිටි ආදායම් රැස්කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත 2007 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දුන් බලපත්‍ර 04 කට හා 2020 සැප්තැම්බර් 07 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට නිකුත් කරන ලද බලපත්‍රයට අදාළව එම ආයතනය විසින් අනුමත කළ වැලි කියුබ් | මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී පත්කර ගන්නා ලද කමිටුව 2023.04.04 දින රැස්වී ගන්නා ලද තීරණය අනුව, ලංකා මිනරල් සැන්ඩ් සමාගම විසින් | රජයට අය විය යුතු ගෙවීම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රමාණය ඉක්මවා වැඩිපුර සිදුකළ කැණීම්වලින් අයවිය යුතු පිළිවෙලින් රු.72,895,000 ක හා රු1,688,515 ක ගාස්තුව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | රජයට අය විය යුතු ගෙවීම් සිදු කිරීමට එකඟතාව පල කර ඇති බව. | |

## 2.2 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන් දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මු. රෙ. 66 සහ මු. රෙ. 69 මාරු කිරීම් මඟින් වැය විෂයයන් 07 ක අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සියයට 23 ක සිට සියයට 300 ක් දක්වා වු පරාසයකින් වෙනස් කර තිබුණු බවට නිරීක්ෂණය විය. | ජාතික අයවැය චක්‍රලේඛ අංක : 03/2022 අනුව වැය විෂයයන් 04 කින් ඉතිරි කරගත් ප්‍රතිපාදන පෙර වර්ෂයේ සිට පවතින ධීවර අමාත්‍යාංශයට කළ යුතු ගෙවීම් කිරීම සඳහා සහ හානි පාඩු කපා හැරීම සඳහාත් , අංක 1404 වැය විෂයයට ප්‍රමාණවත් නොවූ ගෙවල් කුලී ගෙවීම සඳහාත් FR 66 මඟින් මාරු කරගත් බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,704,453 ක් වන බැරකම් තුළ 2019 වර්ෂය වෙනුවෙන් ධීවර අමාත්‍යාංශයට ගෙවිය යුතු රු.2,875,316 ක ආරක්ෂක සේවා මුදලක් හා රු.455,237 ක සේවා වියදමක් පවතින බවට නිරීක්ෂණය විය. | ධීවර අමාත්‍යාංශයට ගෙවිය යුතු හිඟ මුදල් ඉදිරියේදී ප්‍රතිපාදන සම්පාදනය කරගනිමින් ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව. | ප්‍රතිපාදන සීමාවන්වලට යටත්ව බැරකම් ඇති කරගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනයේ සටහන (iii) හා (iv) ප්‍රකාශනයේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති සියළුම බැරකම් අනාවරණය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ රු. 266,233 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය කර නොතිබුණි. | බිල්පත් වගකීම් ලෙස ඇතුළත් කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බව. | ප්‍රතිපදන සීමාවන් තුළ සියලුම වියදම් කළමනාකරණය කරගත යුතු අතර සියලුම බැරකම් මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබූ ඉදිකිරීම් කාර්යයන් 04 කට අදාළ භෞතික ප්‍රගතිය සියයට 5 ත් සියයට 35 ත් අතර පරාසයක ප්‍රමාණයක් වීම හේතුවෙන් එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | මිරිස්ස, මීටර් 120 ඇවිදින මංතීරුව නඩු කටයුත්තක් හේතුවෙන්, අධිකරණ නියෝගය පරිදි ඉදිකිරීම් තාවකාලිකව නවතා ඇත.<br>අම්පාර, නින්දවූර් හි ග්‍රොයින ව්‍යුහ 07 ක් ඉදිකිරීම සඳහා වන වෙරළාරක්ෂක ඉදිකිරීම් ව්‍යාපෘතිය 2023 වසර දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.<br>මොරටුව, ලුනාව මීටර් 500 දිගින් යුත් රිවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ යන්ත්‍ර සඳහා ඩීසල් සපයා ගැනීම අපහසු වීමෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා කර ගැනීමට නොහැකි වූ බව.<br>තිරුක්කෝවිල් හි මීටර් 110 ගේබියන් හා රිවට්මන්ට් ආරක්ෂිත බැම්ම සැකසීමේ ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කරනු ලබන බව. | සැලසුම්ගත ඉලක්කයන් ලබා කරගත යුතු අතර එසේ නොවන විට සැලසුම සංශෝධනය කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 2,228 කින් අනවසර ඉදිකිරීම් 2,069 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම්වලින් වෙරළ මත සහ අධි රක්ෂිත කලාපයේ ඒවා කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කරන අතර ඊට පිටතින් ඇති ඉදිකිරීම් සඳහා අවසර ලබා දීමට යොමු කර ඇති බව. | නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් ඔස්සේ අනවසර ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 හා 2022 වර්ෂයන්හි දිස්ත්‍රික්ක 13 ක ක්‍රියාමාර්ග ගැනීමට තිබූ බවට හඳුනාගත් මුලු අනවසර ඉදිකිරීම් 861 කින් අනවසර ඉදිකිරීම් 255 ක් සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙරළ මත සහ වෙරළ දැඩි රක්ෂිත කලාපය තුළ ඉදි කරන අනවසර ඉදිකිරීම් සඳහා මූලික වශයෙන් ප්‍රමුඛත්වය ලබා දී ඇති බව. | නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් ඔස්සේ අනවසර ඉදිකිරීම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2018 ඔක්තෝබර් 23 දිනැති අංක පීඑෆ්ඩී 05/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් e-GP පද්ධතිය හරහා විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා එහි සඳහන් ආකෘතීන් ප්‍රකාරව ආයතනය විසින් 2015 වර්ෂයේ සිට සිදු කළ ප්‍රසම්පාදන කාර්යයන් පිළිබඳ විස්තර හා 2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර 2018 නොවැම්බර් මාසයේදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළව කිසිදු කාර්යයක් මේ දක්වා සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුව e-GP පද්ධතිය හරහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදුලිය පද්ධතියේ පවතින දෝෂයක් හේතුවෙන් 2022 මාර්තු සිට වසරකට අධික කාලයක් ධාවනය නොකර එකතැන නවතා ඇති වාහනයක් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ද, වටිනාකම රු. මිලියන 11.9 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ Volvo Excavator රථයක් වසර ගණනාවක් තිස්සේ භාවිතයට නොගැනීම හේතුවෙන් ද අබලන් තත්ත්වයට පත්ව දිරායෑමට ලක්වන බවට නිරීක්ෂණය විය. | විදුලි පද්ධතියේ දෝෂයක් මත ධාවනය නොවන මෝටර් රථය අළුත්වැඩියා සිදුකර ධාවනයට සඳහා යෙදවීමටත්, Volvo Excavator රථය අලුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් වාසිදායක නොවන හෙයින් අපහරණය කිරීමටත් තීරණය කර ඇති බව. | වාහන සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කර අවශ්‍ය වන අලුත්වැඩියාවන් හා අපහරණයන් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වටිනාකම රු. 5,800,000 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අංක PD-1046 දරන TOYOTA HILUX ඩබල් කැබ් රථය 2021 නොවැම්බර් 16 වන දින වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණ ද, එහි අයිතිය පැවරීමට හෝ එම වාහනය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නැවත ලබා දීමේ පදනම මත රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දුන් මෙම රථය, නැවත භාර දෙන ලෙස දැන් වූ විට, තවදුරටත් එය භාවිතා කිරීමට අවශ්‍ය බව සඳහන් කර එම අමාත්‍යාංශයෙන් 2023.03.03 දින ලිපියක් එවා ඇති බව. | රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වී ඇති හෙයින් එම වාහනය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජූනි 23 වන දින Hyundai Excavator යන්ත්‍රයට සිදු වී ඇති රු.54,320 ක අලාභය සම්බන්ධ පරීක්ෂණ කටයුතු නිමකර පොතෙන් කපාහැරීමට හෝ අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදාළ වැය විෂයයට FR 66 මඟින් රු.750,000 ක ප්‍රතිපාදන මාරුකිරීමෙන් පසුවද මෙම හානිය පොතෙන් කපා හැරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එය 2023 ජනවාරි මස පොත්වලින් කපා හැරීමට කටයුතු කරන ලද බව. | පරීක්ෂණ කටයුතු නිමකර පොතෙන් කපාහැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශගුණික ආශ්‍රිත වෙරළබඩ ආපදා වැළැක්වීම හා වෙරළබඩ පරිසර පද්ධති තිරසාර ලෙස සංරක්ෂණය කිරීම යන තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ හඳුනාගත් කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ 2021 - 2025 සැලැස්ම තුළ කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ඇතුළත් කර තිබූ නමුත් රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඒවා ක්‍රියාත්මක නොකිරීමට තීරණය කළ බව. | සැලසුම්ගත කාර්යයන් ක්‍රියාත්මක කර ඉලක්ක කරා ළඟා විය යුතු අතර එසේ කළ නොහැකි අවස්ථාවන්වලදී සැලසුම් සංශෝධනය කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 541ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්, තෘතීය හා ද්විතික මට්ටම්වල තනතුරු 67 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 66 ක් වශයෙන් තනතුරු 148 ක් පුරප්පාඩුව පැවතුණු අතර සංවර්ධන නිලධාරි තනතුරු 24 ක අතිරික්තයක් විය. පුරප්පාඩු පියවා ගැනීමට හෝ පවතින තනතුරු සංඛ්‍යාව මත රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර අවශ්‍යතාවය අනුව සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු වී පවතින අතිරේක අධ්‍යක්ෂ ජනරාල් හා සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීමටත්, අධ්‍යක්ෂ (වෙරළ සම්පත් කළමනාකරණ) තනතුරේ වැඩ බැලීම සඳහා පත් කිරීමටත්, අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කර ඇති අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවය) තනතුරු සඳහා අනුයුක්ත කිරීම සිදු කරමින් පවතී.<br><br>ජල විද්‍යා මිනුම්දෝරු තනතුර සඳහා සුදුසු නිලධාරීන් ලබා දීමට කටයුතු කරන බව මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇත.<br><br>සිවිල් ඉංජිනේරු සහ පාලන නිලධාරී යන තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර සංවර්ධන නිලධාරී අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බව. | අවශ්‍ය අනුමැතීන් ලබාගෙන බඳවා ගැනීම් සිදු කිරීමට හෝ පවතින කාර්යමණ්ඩලය මත කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |